**පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය - 2019**

**----------------------------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශ්වයන්ගේ වගකීම්**

**----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ආයතනය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශ්ව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තව ද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 02** | | |
| රු.522,436 ක් වූ පොලී ආදායම්, මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ඉවත් කළ යුතු අයිතමයක් වුව ද මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයෙන් අඩු කර නොතිබුණු අතර වර්ෂය තුළ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණු රු. 16,000,000ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි. | පෙන්වා දී ඇති කරුණු සමඟ එකඟ වන අතර, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ප්‍රමිත ප්‍රකාරව ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කළමනාකරණයේ අවධානය යොමු කරවමි |
| **(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 09** | | |
| ප්‍රමිතියේ 15 ඡේදය අනුව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට තොගය වාර්තා කළ යුතු වුවත් රු. 1,517,202ක් වූ කල් ඉකුත් වූ ප්‍රකාශන තොගය ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරිමකින් තොරව පිරිවැයට වාර්තා කර තිබුණි. | පෙන්වා දී ඇති කරුණු සමඟ එකඟ වන අතර, මෙම ප්‍රකාශන තොග සම්බන්ධයෙන් ආයතනික විගණන හා කළමනාකරණ රැස්වීමේදී ලබා දුන් උපදෙස් අනුව එම තොග භෞතිකව ගණනය කිරීම මේ වන විට ආරම්භ කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතවල නියමයන්ට අනුව තොග අගය කිරීමට ක්‍රියා කළ යුතු බවට කළමනාකරණයේ අවධානය යොමු කරවමි. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හිමිකම යටතේ සඳහන් කර ඇති රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන රු. 506,057,702 ගිණුම්ගත කිරීමට අදාළ ගිණුම් ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණ අතර එකතු වටිනාකම රු. 2,601,484ක ප්‍රදාන මුදලට අදාළ වත්කම් හඳුනාගෙන ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. | පෙන්වා දී ඇති කරුණ සමඟ එකඟ වන අතර, ඉදිරියේදී ප්‍රදාන ගිණුම්ගත කිරීමේ හා ක්‍රමක්ෂය ප්‍රතිපත්තියක් හඳුන්වාදීමට බලාපොරොත්තු වේ. | ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තියක් හඳුන්වා දිය යුතු ය. |
| (ආ) දේපළ, පිරියත හා උපකරණවල ගොඩනැගිලි හා පුස්තකාල පොත් සඳහා රු.218,774ක් වැඩියෙන් ක්ෂය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ආයතනික වත්කම් ප්‍රත්‍යාගණනයේදී ගොඩනැගිලි හා පුස්තකාල පොත් ප්‍රත්‍යාගණනය සිදු නොකළ බැවින් 2019 සැප්තැම්බර් 01 දින සිට 2019 දෙසැම්බර් 31 දක්වා එම වත්කම් කාණ්ඩවල ක්ෂය ගණනය කිරීම සිදු කරන ලද්දේ පිරිවැය මත ය. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ක්ෂය වියදම නිවැරදිව ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු ය. |

**1.6 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)සේවයෙන් පහ කළ සහ ඉල්ලා අස් වූ නිලධාරීන් 14 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.1,272,582ක ණය ශේෂ හා මියගොස් සිටින නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 805,860ක ණය ශේෂය පිළිබඳ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | පෙන්වා දීම සත්‍යයක් වන අතර ඇතැම් ණය ශේෂයන් මේ වන විට ගෙවීමට නියමිත පාරිතෝෂික මුදලෙන් අදාළ අනුමැතීන් සහිතව හිලව් කිරීම, ඇපකරුවන්ගෙන් අයකිරීම හා සුරැකුම් පිළිබඳ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම යනාදිය තුළින් අයකිරීමට කටයුතු ආරම්භ කොට ඇත. | ණය ශේෂ අය කර ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතු ය. |

| | | |
|---|---|---|
| (ආ) ආයතනය විසින් 2015 වර්ෂයේදී මුද්‍රණය කරන ලද දිනපොත් වෙනුවෙන් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.492,000ක මුදල 2018 වර්ෂය තුළදී ද ලැබී නොතිබුණි. | අවස්ථා ගණනාවකදී අමාත්‍යාංශය දැනුවත් කළ ද මෙතෙක් එම මුදල ලැබී නොමැත. | ලැබිය යුතු මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු කරවමි. |
| (ඇ) විධිමත් විනය පරීක්ෂණයකින් වරදකරු බවට පත්වීම හේතුවෙන් සේවයෙන් පහකළ රියදුරු මහතාගෙන් අයකළ යුතු මුදල අයනොකර පාරිතෝෂික ගෙවීම හේතුවෙන් හිඟහිටින ලද රු. 175,596 ක මුදලෙන් ඉතිරි ශේෂය වූ රු. 160,596 ක මුදල විධිමත් පරිදි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ මුදල අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කෙරේ. | පාරිතෝෂික ගෙවීමේදී අයකරගත යුතු වූ, එහෙත් අය නොකළ මුදල වහා ම අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ). **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 15.1 (IX)** වගන්තිය | නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නොපැවැත්වීම හේතුවෙන් නිලධාරීන් 35ක සේවය ස්ථිර කිරීම සහ උසස් කිරීම විධිමත්ව සිදු වී නොතිබුණි. | අනුමැතිය සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකර ඇත. | ආයතන සංග්‍රහයේ සඳහන් කර ඇති පරිදි නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීමට හා විධිමත්ව පරිදි නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීම සහ උසස් කිරීම කළ යුතු ය. |
| (ආ). **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 (අ)** | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අරමුණුවලට පටහැනිව රු. 742,288ක වටිනාකමකට මිලදීගෙන තිබූ CCTV කැමරා පද්ධතිය සම්බන්ධයෙන් දෙපාර්ශ්වයන් අතර ගිවිසුමකට එළඹ නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ) 8.9.3අ ( දෙනුව ගනු සම්බන්ධයෙන් දෙපාර්ශ්වය අතර ගිවිසුමකට එළඹීම කළ යුතු බව සඳහන් නිරීක්ෂණය පිළිගනිමි. තව ද ඉදිරියේදී මෙවැනි කටයුතු සිදු කිරීමේදී විධිමත් ගිවිසුම් පිළියෙළ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | | කිරීමට කටයුතු කරනු ලැබේ. වර්තමානය වනවිට අදාළ සැපයුම්කාර ආයතනය වගකීමේ සහතිකයක් ලබා දීම සිදු කොට ඇත. | |
| (ඇ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 වන වගන්තිය | ක්‍රියාකාරී සැලැස්ම වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව පිළියෙල කර නොතිබුණි. | මෙම ගැටලුව පසුගිය විගණන විමසුම් මගින් ද දැනුම් දී තිබූ අතර වර්ෂ 2020යේ ආයතනික ක්‍රියාකාරී සැලැස්ම 01/2014 මුදල් රාජ්‍ය චක්‍රලේඛ ප්‍රකාරව පිළියෙල කරන ලදී. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 935,590ක ඌනතාවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 2,836,486ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,772,076ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විශේෂ ව්‍යාපෘති ආදායම රු. 7,808,191කින් ද, සහතිකපත්‍ර ආදායම රු.3,075,375කින් ද අඩු වීම සහ ඊට සමානුපාතිකව වියදම් පහළ නොයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ). පෙර වර්ෂයට සාපේක්ෂව විශේෂ ව්‍යාපෘති ආදායම රු. 7,808,191කින් එනම් සියයට 61.75කින් අඩු වී තිබුණු අතර සහභාගීත්ව පාලනය නංවාලීම සඳහා ප්‍රජා සංවිධාන සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ පළාත් පාලන ආයතන සඳහා නව ගිණුම්ක්‍රමයක් හඳුන්වා දීමේ ව්‍යාපෘතිය හා මොඩියුල සකස් කිරීමේ ආදායම සමාලෝචිත වර්ෂයේදී අඩුවීම මෙකී අඩුවීමට හේතු වී තිබුණි. සහතිකපත්‍ර පාඨමාලා රු.3,075,375කින් හෙවත් සියයට 76.31කින් අඩු වී තිබුණි.

(ආ). මානව සම්පත් සංවර්ධන වියදම රු. 5,229,908කින් හෙවත් සියයට 25.07කින් වැඩි වී තිබුණු අතර ආයතන හා පරිපාලන වියදම රු. 2,007,738කින් හෙවත් සියයට 5.55කින් වැඩි වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පහත පරිදි වේ.

| අනුපාතය | වර්ෂය | |
| --- | --- | --- |
| | **2019** | **2018** |
| ජංගම වත්කම් අනුපාතය | 11 : 1 | 8 : 1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 11 : 1 | 7 : 1 |

ආයතනයට අවශ්‍ය ප්‍රශස්ත ජංගම හා ක්ෂණික වත්කම් අවශ්‍යතා පිළිබඳ ඇගයීමක් නොකිරීම නිසා ජංගම වත්කම් හා ක්ෂණික වත්කම් අනුපාත ඉහළ අගයක් ගෙන තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනයේ සමස්ත කාර්ය මණ්ඩලයට විධිමත් පරිදි රාජකාරී පැවරීමේ ලිපි ලබා දී නොතිබුණු අතර කාර්යමණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් ඇති වූ නව තනතුරු සඳහා කාර්යමණ්ඩලය අන්තර්ග්‍රහණය කර ගැනීමට හා බඳවා ගැනීමට අදාළ වන බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමේ කටයුතු මෙම වාර්තාවේ දිනය දක්වා සිදු කර නොතිබුණි. | පෙන්වා දී ඇති කාරණය සමග එකඟ වන අතර2019 , පෙබරවාරි 25 න්තර ලිපිය මගින් සියලු දිනැති අභ්‍ය සේවක මණ්ඩලයට අදාළ රැකියා මූලික විස්තර සකස් කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කරන ලද අතර වර්තමානය වන විට මෙම කාර්යය බහුතරයකගේ සම්පූර්ණ කොට ඇත. වර්තමානය වන විට අනුමත කරන ලද ඇතැම් තනතුරුවල සංශෝධනය හා නිවැරදි කිරීම් සඳහා වන දැනුම්දීම කළමනාකරණය සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත . එමෙන්ම විෂය මූලික දැනුමක් සහිත පුද්ගලයන්ගෙන් යුතු කමිටුවක් වෙතින් අදාළ කාර්යය සම්පූර්ණ කිරීමට අදාළ කටයුතු ආරම්භ කොට ඇත. | අදාළ සංශෝධන කටයුතු කඩිනමින් සිදු කළ යුතු ය. |

## 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී භාණ්ඩාගාරයෙන් ලබා දී තිබූ පුනරාවර්තන ප්‍රතිපාදනය රු.50,000,000ක් හා පුහුණු කිරීමේ වියදම් ද ඇතුළුව මූලධන ප්‍රතිපාදනය රු.75,000,000න් රු.62,335,000ක් හෙවත් සියයට 50ක් උපයෝජනය කර නොතිබුණි. | අරමුදල් ලැබීම ප්‍රමාද වීම මූලධන වියදම් අඩු වීමට ද, පුරප්පාඩු පැවතීම පුනරාවර්තන වියදම අඩුවීමට ද හේතු විය. | උපයෝජනය කළ හැකි ප්‍රමාණයට ප්‍රතිපාදන වෙන්කර ගත යුතු ය. |

## 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය සඳහා මහල් 4කින් යුතු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2013 වර්ෂයේදී ලංසු කැඳවා කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන රු. 53,196,907ක කොන්ත්‍රාත් ගිවිසුමට එළඹ තිබුණු අතර ගොඩනැගිල්ලේ පයිල් අත්තිවාරම ඉදිකිරීම ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් උපකොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි. මෙම මහල් 04කින් යුත් ගොඩනැගිල්ල මහල් 8ක් දක්වා වැඩිකිරීමට 2013 නොවැම්බර් 04 දින ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කර ප්‍රධාන කොන්ත්‍රාත්කරු වෙත ලිඛිතව දැනුම් දී තිබුණ ද ඒ සම්බන්ධව ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් උපකොන්ත්‍රාත්කරු දැනුවත් නොකිරීම හේතුවෙන් මහල් 4කට පමණක් ප්‍රමාණවත් පරිදි පයිල් අත්තිවාරම ඉදිකර තිබුණි. එසේම, මෙම අත්තිවාරම මත ගොඩනැගිල්ල ඉදිකිරීම සුදුසු නොවන බව ආයතනය විසින් පිළිගෙන ඇති බැවින් මේ සඳහා දරන ලද රු. 44,757,072ක වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | මුදල් අමාත්‍යාංශයේ නිර්දේශ ප්‍රකාරව ගෙවා ඇත. මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම අසාර්ථක වී ඇති නිසා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලයට 2017 දෙසැම්බර් මස 19 වන දින එවකට සිටි පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා ඉදිරිපත් කර ඉදිරිකිරීම් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇත.<br><br>එහෙත් , මෙතෙක් එකී ගිවිසුම් අවලංගු කර නැති අතර මෙම ආයතනයේ පාලක මණ්ඩලය පත් කළ විගස එම ගිවිසුම් අවලංගු කිරීම සඳහා ඉදිරි පියවර ගනු ලබන බව වාර්තා කරමි. | රජයට සිදුව ඇති පාඩුව අයකර ගැනීම සඳහා විධිමත් පරිදි කටයුතු කළ යුතු ය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අපද්‍රව්‍ය කළමනාකරණය පළාත් පාලන ආයතනවල ප්‍රධාන කර්තව්‍යයක් වුව ද ඊට අදාළ කිසිදු පුහුණු වැඩසටහනක් හෝ වැඩමුළුවක් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම වර්ෂයේ පැවැත්වීමට සාකච්ඡා කරමින් පවතී. | අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්විය යුතු ය. |

### 4.2 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | පනතේ විධිවිධාන ප්‍රකාරව ආයතනය කටයුතු කළ යුතු ය. |